# කාර්ය සාධන වාර්තාව - 2018

කර්මාන්ත හා වානිජ කටයුතු, දිගු කාලීනව අවතැන් වූවන් නැවත පදිංචි කිරීම සමුපකාර සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

# පෙරවදන

සියවසකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලාංකික ජන සමාජයේ උන්නතිය උදෙසා සුවිශේෂී ප්‍රතිපත්ති හා ආචාරධර්ම අනුව ක්‍රියාත්මක වන සමුපකාර ව්‍යාපාරය, වෙළඳපොල අභියෝග හමුවේ තම අරමුණු ළඟා කර ගැනීමට ප්‍රජාව සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකර දීමට කැප වී සිටී.

ජන සමාජය තුළ ස්ථාපිත හර පද්ධතීන් ආරක්ෂා කරමින් සමුපකාර ව්‍යාපාරය තවදුරටත් ජාතික සංවර්ධන කාර්යයන් උදෙසා සක්‍රීයව දායක කර ගැනීමට රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත විශාල වගකීම් රාශියක් පැවරී ඇති අතර 2018 වර්ෂය තුළ එම වගකිම නොපිරිහෙලා ඉටු කිරීමට කැපවී කටයුතු කරන ලදි. නිශ්චිතවම කිසියම් පළාතකට සීමා නොවන සමුපකාර සමිති/සංගම් ගොඩනැඟී ඇති අතර එම සමුපකාර සමිති/සංගම් වල නියාමන කටයුතු රේඛීය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත. ඊට අමතරව පළාත් මට්ටමින් විවිධ නෛතික විධිවිධානයන් තුළ සමුපකාර සමිති ක්‍රියාත්මක වීමේදී පළාත් කොමසාරිස්වරුන් සමඟ අදාළ නෛතික හා කළමණාකරණ කටයුතු පිළිබඳ තීරණ ගැනීම හා පළාත් කොමසාරිස්වරුන් සමඟ එකඟතාවයෙන් කටයුතු කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියක් පවතී. එසේම ව්‍යාපාරයේ උන්නතිය උදෙසා ජාතික මට්ටමින් නායකත්වය සැපයීම ද මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සුවිශේෂී වගකීමකි.

මිලියන 06ට අධික සමුපකාරිකයින්ගෙන් සමන්විත ශ්‍රී ලාංකේය සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා කැප වී දායකවීම රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීම හා යුතුකම බව තවදුරටත් සඳහන් කරමි.

2018 වර්ෂය සඳහා සකස් කරන ලද මෙම වාර්තාවේ අන්තර්ගත වන්නේ රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් එම වසරට අදාළව ලබා ගත් දත්ත හා තොරතුරු වේ. මෙහි පළමු පරිච්ඡේදයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය හා ව්‍යුහය අඩංගු වන අතර දෙවන පරිච්ඡේදයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය විස්තර කර ඇත. තුන් වන පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ ජාතික මට්ටමේ සමුපකාර සමිති සංගම් පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඇත.

මෙම පොතෙහි අන්තර් ගත සියළු කාර්යයන් 2018 වර්ෂය තුළ සාර්ථක කර ගැනීමට මා හා නිබඳව අත්වැල් බැඳ ගනිමින් එක් සිත්ව එකාවන්ව කැප වී කටයුතු කළ කර්මාන්ත හා වාණිජ කටයුතු දිගුකාලිනව අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශ ලේකම්,අතිරේක ලේකම් (සමුපකාර සංවර්ධන) ඇතුළු කාර්ය මණ්ඩලයටත් දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයටත් සමිති/සංගම් සභාපති,සාමාන්‍යාධිකාරීවරුන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ සුවිශේෂී ස්තූතිය පිරි නමනු ලබන අතරම මීට අමතරව සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරමි.

සුචින්ද.එස්.සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

# දැක්ම

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය

ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා

සානුබල සපයමින්

සමුපකාර සමිති වල යහ පාලනය

ගොඩනැඟීම සඳහා

පුළුල් ලෙස මැදිහත්වීම

# පටුන

01. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්
1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය
1.3.1 කාර්ය මණ්ඩල සංඛ්‍යා හා පුරප්පාඩු
1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරීන්
1.3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්
1.3.4 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්
1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් හා සංවර්ධනය
1.4.1 දේශීය පුහුණු
1.4.2 විදේශීය පුහුණු
1.4.3 දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබූ වෙනත් පුහුණු වැඩසටහන්

02. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවර්ධන ක්‍රියාකාරකම්
2.1 2018 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම
2.2. සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා කාලීනව සංශෝධන සඳහා උපදෙස් ලබාදීම
2.3. සමුපකාර සමිති/සංගම් නිලවරණ පැවැත්වීම
2.4. සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු
2.5. නීති කටයුතු
2.5.1 ආරවුල් බේරුම්කරණය
2.5.2 උසාවි බල ගැන්වීම
2.6. අරමුදල් කළමනාකරණය
2.6.1 සමුපකාර අරමුදල
2.6.2 සමුපකාර අතිරික්ත අරමුදල
2.7. 2018 වර්ෂය සඳහා රජයේ අය වැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම
2.8. ග්‍රාමීය බැංකු නියාමනය
2.9.ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
2.10 මාධ්‍ය කටයුතු
2.11. තොරතුරු තාක්ෂණ ඒකකය

03. ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන
3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්
3.2. වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති
3.2.1. දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
3.2.2. දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති
3.2.3 වර්ෂය තුළ ක්‍රියාත්මක සමුපකාර සමිති



4

# 1 පරිච්ඡේදය

## සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සියවසකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලාංකික ජන සමාජයේ උන්නතිය උදෙසා සුවිශේෂී ප්‍රතිපත්ති හා ආචාර ධර්ම අනුව ක්‍රියාත්මක වන සමුපකාර ව්‍යාපාරය , වෙළඳපොල අභියෝග හමුවේ තම අරමුණු ළඟා කර ගැනීමට අපහසු ප්‍රජාව සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතා ඉටු කරදීමට කැපවී සිටියි.මෙවන් අරමුණු පෙරදැරිව 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද අතර කාර්ය භාරය වඩාත් පුළුල් කරමින් 1945 වර්ෂයේදී "සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව" ලෙස ස්ථාපිත කරන ලදී. එය වර්තමානයේදී කර්මාන්ත, වාණිජ කටයුතු, දිගු කාලීනව අවතැන් වූවන් නැවත පදිංචි කිරීමේ හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතී. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරණ ස්ථානයේ පිහිටා ඇති අතර සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා කැපවීමෙන් කටයුතු කරනු ලබයි.

### 1.1 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යයන්

- ❖ අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම.
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම් වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදු කිරීම
- ❖ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම
- ❖ ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම
- ❖ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම

### සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු

- ❖ සමිති ලියාපදිංචි කිරීම
- ❖ සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
- ❖ සාමාජිකත්වය පිළිබඳ කටයුතු
- ❖ අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
- ❖ නිළවරණ කටයුතු අධීක්ෂණය
- ❖ මහ සභා කැඳවීම / කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
- ❖ ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
- ❖ තීරකකරණ කටයුතු සහ උසාවි බල ගැන්වීම්
- ❖ සමුපකාර සමිති / සංගම් වල වාර්ෂික විගණනයන් සිදු කිරීම

### කළමනාකරණ කටයුතු

- ❖ පාලක මණ්ඩල පත් කිරීම / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම
- ❖ ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
- ❖ විගණනය
- ❖ පනතේ විධිවිධාන පරිදි සාමාන්‍ය / විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
- ❖ කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

## සම්බන්ධීකරණ කටයුතු

- ❖ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය
- ❖ පළාත් සමුපකාර අමාත්‍යවරුන් ,අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයට සහයවීම
- ❖ ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- ❖ සමුපකාර සමිති වලට අදාළ සංඛ්‍යා ලේඛන පිළිබඳව මහ බැංකුව හා ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- ❖ අවශ්‍ය අවස්ථාවන්හිදී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ❖ සමුපකාර සමිති / සංගම් අතර සම්බන්ධීකරණය

## සංවර්ධන කටයුතු

- ❖ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම
- ❖ සමුපකාර සමිති වල යහ පාලනය සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම
- ❖ සමුපකාර සමිති හා සංගම් වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම
- ❖ සමුපකාර සමිති හා සංගම් වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය
- ❖ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ❖ සංවර්ධන ආධාර හා සානුබල සැපයීම
- ❖ සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය
- ❖ සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය
- ❖ සේවක / නිළධාරී සුභසාධනය

## අරමුදල් පාලනය

- ❖ දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය
- ❖ ව්‍යවස්ථාපිත සමිති වල වාර්ෂික විගණනයෙන් පසු වෙන් කරනු ලබන දායක මුදල් අය කර ගැනීම
- ❖ සමුපකාර සමිති වල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබාදීම
- ❖ ණය ආපසු අය කර ගැනීම
- ❖ ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීම

## අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු

- ❖ සාමාන්‍ය පරිපාලනය
- ❖ මානව සම්පත් කළමනාකරණය
- ❖ කාර්යසාධනය වර්ධනය
- ❖ වත්කම් කළමනාකරණය

## 1.2 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය

2018 වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අංශ 09 ක් ලෙස සංවිධානය වී ක්‍රියාත්මක වී ඇත. එනම්

1. පාලන අංශය
2. මුදල් අංශය
3. සමිති අංශය
4. සංවර්ධන අංශය
5. විගණන අංශය
6. නීති අංශය
7. අරමුදල් අංශය
8. බැංකු නියාමන අංශය
9. තොරතුරු තාක්ෂණ අංශය

# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



## 1.3 සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

මෙම දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි 2018 වසර තුළ සිදු වූ සුවිශේෂී සිදුවීම් කිහිපයකි.

2018 වර්ෂයෙහි මුල් භාගයේදී මෙම දෙපාර්තමේන්තුව සඳහා විශාල අඩුපාඩුවක්ව පැවති සහකාර කොමසාරිස් පුරප්පාඩු 02 සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගැනීමට හැකියාව ලැබුණි. පරිපූර්ණ හැකියාවන් සමුදායකින් යුතු එම නිලධාරීන් සංවර්ධන හා පාලන අංශයෙහි සහකාර කොමසාරිස් තනතුරු සඳහා පත්වීමත් සමගම දෙපාර්තමේන්තුවෙහි රාජකාරී කටයුතු සිදු කරගෙනයාම වඩාත් පහසු විය.එසේම මෙම වර්ෂය තුළ දෙපාර්තමේන්තුවෙහි ගණකාධිකාරී උසස්වීම් ලැබ ස්ථාන මාරු වී යාමත් සමඟ කොන්ත්‍රාත් පදනම මත ගණකාධිකාරීවරියක වැඩභාර ගන්නා ලදී.

එසේම පෞද්ගලික අංශය හා තරඟ කරමින් ඉදිරියට යන සමුපකාර ව්‍යාපාරය සඳහා මඟ පෙන්වීමට නව තාක්ෂණික දැනුම එක් කරමින් ගොඩනැඟු තොරතුරු තාක්ෂණ අංශය සඳහා විශාල අඩුපාඩුවක්ව පැවති තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙකු පත්වීම් ලැබ දෙපාර්තමේන්තුව වෙත අනුයුක්තවීම මෙම වර්ෂය තුළ සිදු වූ සුවිශේෂීම සිදුවීමකි.එසේම තොරතුරු තාක්ෂණ සහකාර II, III ශ්‍රේණි සඳහා ද නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු මෙම වසර තුළ සිදු කරගෙන යමින් පැවතුණි.

දෙපාර්තමේන්තුවේ නීතිමය ගැටළු විසඳා ගැනීමේ අරමුණින් අනුමත කර ගනු ලැබූ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ මූලික කටයුතු සිදු කරමින් අදාළ බඳවා ගැනීම් පටිපාටිය අනුමත කර ගැනීමට මෙම වසර තුළදී හැකියාව ලැබුණි. සමුපකාර සංවර්ධන නිලධාරී අධිශ්‍රේණිය තනතුරු පුරප්පාඩු 02 ක් මෙම වසර තුළ පුරප්පාඩුව පැවති අතර ඒ සඳහා බඳවා ගැනීම් සිදු කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබා ගන්නා ලදී. එසේම භාෂා පරිවර්තක තනතුර පුරප්පාඩුව සම්පූර්ණ කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියෙකු බඳවා ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා බඳවා ගැනීම් සඳහා යොමු කර ඇත. කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශයේ විගණන කළමණාකරන කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදී අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

තවද රාජ්‍ය කළමණාකරන සහකාර III වන ශ්‍රේණියේ නව පත්වීම් ලබාගත් නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහායකIII වන ශ්‍රේණියේ නව පත්වීම් ලැබූ නිලධාරීන් කිහිපදෙනෙකු සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා රාජකාරී ඉටු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ සේවයට 2018 වර්ෂය තුළදී එක් විය. එසේම සමුපකාර සංවර්ධන නිලධාරීන් සහ රාජ්‍ය කළමණාකරන සහකාර සේවයේ නිලධාරීන් ද ස්ථාන මාරු වී යාමත් ස්ථාන මාරු වී පැමිණීමත් වරින් වර අවස්ථා කිහිපයකදී සිදු විය.

ඉහත දැක් වූ ආකාරයට කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සමුපකාර ව්‍යාපාරයේ ප්‍රගමනය උදෙසා දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය අනුව නව තනතුරු ඇති කිරීම තුළින් දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී

## 1.3.1 කාර්යමණ්ඩලසංඛ්‍යාහාපුරප්පාඩු

මෙම දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු හා එම තනතුරුවල 2018.12.31 දිනට සේවය කළ සංඛ්‍යාව හා පුරප්පාඩු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | අනුමත වර්තමාන සේවක සංඛ්‍යාව | 2018.12.31 දිනට සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | සමුපකාර සංවර්ධන කොමසාරිස් සහසමුපකාර සමිති රෙජිස්ට්‍රාර් (ශ්‍රී ලංකා පරිපාලන සේවය I) | 01 | 01 | 00 |
| | නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස්(ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III) | 04 | 02 * | 04 |
| | ගණකාධිකාරී(ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය II, III) | 01 | 01* | 01 |
| | නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුගත) | 03 | 03 | 00 |
| | නීති නිලධාරී(දෙපාර්තමේන්තුගත III, II) | 01 | 00 | 01 |
| | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ(ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සේවය III, II) | 01 | 01 | 00 |
| | **එකතුව** | **11** | **08** | **06** |
| තෘතිය මට්ටම | පරිපාලන නිලධාරී | 01 | 01 | 00 |
| | සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය | 05 | 03 | 02** |
| | භාෂා පරිවර්තක | 01 | 00 | 01 |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සේවය-2 පන්තිය III, II) | 02 | 00 | 02 |
| | **එකතුව** | **09** | **04** | **05** |
| ද්විතිය මට්ටම | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 62 | 21<br>52<br>31 | 10 |
| | සමුපකාර සංවර්ධන නිලධාරී | | | |
| | සංවර්ධන නිලධාරී | 15 | 09 | 06 |
| | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර(ශ්‍රී ලංකා තොරතුරු හා තාක්ෂණ සේවය-3 පන්තිය III, II) | 05 | 00 | 05 |
| | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28 | 26 | 02 |
| | **එකතුව** | **110** | **88** | **22** |
| ප්‍රාථමික මට්ටම | රියදුරු | 05 | 04 | 01 |
| | කාර්යාල කාර්ය සහායක | 15 | 12 | 03 |
| | **එකතුව** | **20** | **15** | **05** |
| | **මුළු එකතුව** | **150** | **115** | **38** |

*කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික නිලධාරීන් තිදෙනෙක් මෙම තනතුරු 03හි රාජකාරී කටයුතු සිදුකරනු ලබයි

**සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය පුරප්පාඩු 02න් එක් පුරප්පාඩුවක් සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියක් රාජකාරී ආවරණයට පත්කරඇත.

## 1.3.2 නව පත්වීම් ලබා පැමිණි නිලධාරින්

| අනු අංකය | නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | කේ.එම් ඉනාමුල් හසන් මයා | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 2018.07.18 |
| 02 | පී.වයි.එන් උදයාංගනී මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 03 | ජේ.එල්.එම් දිල්රුක්ෂි මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 04 | බී.එල්.එන් ක්‍රිෂාන්ති මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 05 | එම්.අයි සාරා මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 06 | ඒ.ජී.ඩී ලක්මාලි මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 07 | පී.බී.ඩී.එස් ප්‍රනාන්දු මයා | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.15 |
| 08 | කේ.ජී ඉරෝෂා මිය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.16 |
| 09 | ඩී.එස්.යූ විතාරණ මයා | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.05.28 |
| 10 | එම්.බී.එස් පියුමිකා මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.10.19 |
| 11 | ඕ.ටී විතානආරච්චි මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.10.19 |
| 12 | එච්.කේ.ඒ.එල් මධුෂානි මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.10.19 |
| 13 | ජී.වී.එස් ද සිල්වා මයා | රාජ්‍ය කළමණාකරන සහකාර III | 2018.10.31 |
| 14 | යූ.ජී.සී ලක්රුවන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2018.11.01 |
| 15 | ආර්.එම් රුක්ෂාන් මයා | කාර්යාල කාර්ය සහයක III | 2018.11.01 |

## 1.3.3 ස්ථාන මාරුවීම් ලබා පැමිණි නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරුවීම් ලබා පැමිණි දිනය |
|---|---|---|---|
| 01 | ඩබ්ලිව්.එන්.ඩබ්ලිව්.ඩී ගුණවර්ධන මිය | සමුපකාර සංවර්ධන නිලධාරී I | 2018.06.13 |
| 02 | බී.ඒ.එම නස්රීන් මයා | සමුපකාර සංවර්ධන නිලධාරී II | 2018.12.12 |
| 03 | කේ.ඩබ්.ඒ.ඒ තාමරස මයා | රාජ්‍ය කළමණාකරන සහකාර II | 2018.03.02 |

## 1.3.4 ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු ලැබූ දිනය |
|---|---|---|---|
| 01 | ටී.එම්.එන්.ආර් බණ්ඩාර මයා | ගණකාධිකාරී | 2018.09.25 |
| 02 | එස්.ඒ.ජේ චන්ද්‍රකුමාර මයා | සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර | 2018.03.09 |
| 03 | එන්.එච් පල්ලියගුරුගේ මිය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.03.01 |
| 04 | මොහාන් ද සිල්වා මයා | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.03.21 |
| 05 | කේ.ඩී.එම්.පී කිරිඇල්ල මිය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.05.13 |
| 06 | ආර්.එස්.එස් රත්නායක මෙය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.05.13 |
| 07 | කේ.ඒ.එන් සමින්දනී මෙය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.05.13 |
| 08 | ජේ.එල්.එන්.ඩී ජයසිංහ මිය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.05.30 |
| 09 | ආර්.එම්.කේ.සී විජේරත්න මෙය | සමුපකාර සංවර්ධන නිලධාරී | 2018.05.31 |
| 10 | සී.ඩී පනාගොඩ මිය | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.03.02 |
| 11 | යූ.ඩී.ඒ යසාංගනී මිය | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.05.24 |
| 12 | ආර්.ඒ.ආර්.ආර් කුමාර මයා | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.05.24 |
| 13 | ඒ.එන් කිඹියහෙට්ටි මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.05.25 |
| 14 | ආර්.එම්.ඩී.කේ රත්නායක මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.05.28 |
| 15 | කේ.ජී ඉරෝෂා මෙය | රාජ්‍ය කළමණාකරන සහකාර | 2018.12.03 |
| 16 | නදීකා මුණසිංහ | කාර්යාල කාර්ය සහායක (රාජ්‍ය කළමණාකරන සහකාර නව පත්වීම් ලබා ස්ථාන මාරුවී යන ලදී) | 2018.05.14 |

## 1.4 කාර්ය මණ්ඩල පුහුණු කිරීම් සහ සංවර්ධන

### 1.4.1 දේශීය පුහුණු

2018 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලාවන්ට සහභාගී කරවා ඇත.

| | පුහුණු වැඩසටහන | සංවිධානය කළ ආයතනය | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 01 | දේපල / උපකරණ සබැඳියාව , ස්ථාවර වත්කම් පවත්වා ගෙන යාම , නඩත්තු පිළිබඳව පුහුණු වැඩමුළුව | SDFL | 2018.02.26 | කේ.ඩී.ආර්.නිලන්ති මිය (රාජ්‍ය කළමණාකරන සහකාර) යූ.එල්.ඩී.ධනංජලී මෙය (රාජ්‍ය කළමණාකරන සහකාර) එස්.ඒ.ජේ.මීමනගේ මයා (රාජ්‍ය කළමණාකරන සහකාර) කේ.ඒ.එන් රත්නායක මයා (රාජ්‍ය කළමණාකරන සහකාර) |
| 02 | පර්යේෂණ නිබන්ධනයක් පිළියෙල කිරීමේ පුහුණුව | NICD | 2018.04.23/24 | කසුන් මාරසිංහ මයා (සමුපකාර සංවර්ධන නිලධාරී) නිර්මලා කරුණාසේන මෙය (සමුපකාර සංවර්ධන නිලධාරී) ආර්.එස්.එස්. රත්නායක මෙය (සමුපකාර සංවර්ධන නිලධාරී) ඒ.එන්.රංජන් මයා (සමුපකාර සංවර්ධන නිලධාරී) |
| 03 | Stores Management & Purchasing Procedures | SDFL | 2018.04.26 - 27 | එස්.ඒ.ජේ.මීමනගේ මයා (රාජ්‍ය කළමණාකරන සහකාර) |
| 04 | Salary Conversions | SDFL | 2018.05.21-22 | එන්.ඒ.එච්.පීරිස් මෙය (රාජ්‍ය කළමණාකරන සහකාර) |
| 05 | කාර්යාල උපකරණ පාලනය පිළිබඳ වැඩමුළුව | SDFL | 2018.05.21 - 22 | එස්.ඒ.ජේ.මීමනගේ මයා ( රාජ්‍ය කළමණාකරන සහකාර) |
| 06 | Train the Trainer ( TOT ) | SDFL | 2018.05.14 – 18 | කේ.ආර්.ටී.සෝමරත්න මිය (සංවර්ධන නිලධාරී) |
| 07 | Procurement Procedures | SDF | 2018.5.31 - 2018.06.01 | කේ.එම්.මිනෝලි මිය (රාජ්‍ය කළමණාකරන සහකාර) ආර්.එම්.පී.එස්.රත්නායක මයා (රාජ්‍ය කළමණාකරන සහකාර) |
| 08 | කාර්යාල කාර්ය සහායක සේවයේ රාජකාරී පුහුණුව | SDFL | 2018.06.05/06 | ඩයනා දසානායක මිය (කාර්යාල කාර්ය සහායක) |
| 09 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | SDFL | 2018.06.20 සිට සිකුරාදා දින 10ක් | අර්ජුන තාමරස මයා (රාජ්‍ය කළමණාකරන සහකාර) |

## 1.4.2 විදේශීය පුහුණු

2018 වර්ෂය තුළ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සාමාජිකයන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන , පුහුණු , ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී ඇත.

| | වැඩසටහන | කාල පරිච්ඡේදය | පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරීන් |
|---|---|---|---|---|
| 01 | International programmes on Women's Development through income Generating Activities | 2018.03.19-2018.03.22 | India (Pune) | L.H.M. Buddhima Lansakara (development Officer) |
| 02 | International programmes on Women's Development through income Generating Activities | 2018.03.19-2018.03.22 | India (Pune) | F.B.I.G. Dilrukshi (cooperative development Officer) |
| 03 | SDG 12 - Responsible Consumption and Production, | 2018.04.23-2018.04.26 | Kuala Lumpur, Malaysia | S.L. Nasser (Cooperative Development Commissioner) |
| 04 | International programmes on Renewable Energy Management for Cooperatives | 2018.08.20-2018.08.24 | Pune, India | E.M.A.C. Ekanayaka (cooperative development Officer) |
| 05 | International programmes on Renewable Energy Management for Cooperatives | 2018.08.20-2018.08.24 | Pune, India | G.H. Ayodya Wijesinghe (cooperative development Officer) |
| 06 | International Programe on Development of Rural financing Institutions and Cooperatives | 2018.10.08-2018.10.12 | Nepal | J.M.P.P. Jayasundara (cooperative development Officer) |
| 07 | International Programe on Development of Rural financing Institutions and Cooperatives | 2018.10.08-2018.10.12 | Nepal | P.D.T.M De Silva (cooperative development Officer) |
| 08 | Annual Study Tour of Sri Lanka Cooperative Rural Bank Federation Ltd. | 2018.08.19-2018.08.25 | France/ Netherland | S.L. Nasser (Cooperative Development Commissioner) |
| 09 | Seminar on Tourism Development for Developing Countries in 2018 | 2018.09.01-201809.10 | China | B.M.M. Bandula (Assistant Commissioner) |
| 10 | Seminar on Tourism Development for Developing Countries in 2018 | 2018.09.01-201809.10 | China | P.C. Rajapaksha (Cooperative Promotion and Investigation Officer) |
| 11 | Cooperative Study Tour | 2018.09.07-2018.09.12 | Nepal | T.A.J.R. Jayathilaka (Cooperative Fund Clerk) |
| 12 | Cooperative Study Tour | 2018.09.07-2018.09.12 | Nepal | R.M.P.S. Rathnayaka (Management Assistant) |
| 13 | 13th ICA-AP Regional Assembly and Related events | 2018.11.26-2018.11.30 | Iran | S.L. Nasser (Cooperative Development Commissioner) |
| 14 | Dairy Development through Cooperative Business Model | 2018.12.10-2018.12.14 | India | K.R.T. Soomarathna (development Officer) |
| 15 | Dairy Development through Cooperative Business Model | 2018.12.10-2018.12.14 | India | H.M.M.C. Herath (cooperative development Officer) |

## 1.4.3 දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබූ වෙන්ත් පුහුණු වැඩසටහන්

| අනු අංකය | දිනය | වැඩමුළුවේ නම | සහභාගීවූවන් |
|---|---|---|---|
| 01 | 2018.07.31 | අන්තර්ජාල හා පරිගණක පුහුණුව | දෙපාර්තමේන්තු නිලධාරීන් 15 දෙනෙකු |
| 02 | 2018.08.09/10 | සී/ස ශ්‍රී ලංකා ව්‍යවසාය සංවර්ධන සමිතිය ( සමුපකාර ව්‍යාපාරය හා එහි නෛතික කටයුතු ) | සමිති නිලධාරීන් |
| 03 | 2018.09.08 | රාජ්‍ය නිලධාරීන්ගේ විනය | දෙපාර්තමේන්තු සමස්ත නිලධාරීන් සඳහා |
| 04 | 2018.09.25 | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | දෙපාර්තමේන්තු සමස්ත නිලධාරීන් සඳහා |
| 05 | 2018.11.01 දින සිට වසරක කාලයක් | සමුපකාර සංවර්ධන නිලධාරීන්ගේ සහතික පත්‍ර පාඨමාලාව | 2017.11.07 දින පත්වීම් ලැබූ සමුපකාර සංවර්ධන නිලධාරීන් 09 |
| 06 | 2018.11.27 | කාර්යාල ක්‍රම | සමස්ත දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා |
| 07 | 2018.12.18 | මුදල් රෙගුලාසි පුහුණු වැඩමුළුව | සමස්ත දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා |

**2 පරිච්ඡේදය**

# සංවර්ධන ක්‍රියාකාරකම්

## 2.1 2018වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම.

2018 වර්ෂය තුළ සමුපකාර සමිති කිහිපයක් ලියාපදිංචි කර ඇත.

| | සමිති/සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ජාතික විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ සමුපකාර සමිතිය | සමු 57 | 2018.02.21 |
| 02 | සී/ස ජනමාධ්‍යවේදීන්ගේ සමුපකාර සමිතිය | සමු 58 | 2018.02.22 |
| 03 | සී/ස ශ්‍රීලංකා අත්‍යන්ත්‍ර නිෂ්පාදනකරුවන්ගේ අලෙවි කිරීම් හා ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතිය | සමු 59 | 2018.05.28 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය | සමු 60 | 2018.08.08 |
| 05 | සී/ස සමස්ත ලංකා විදේශ භාෂා අධ්‍යාපන ප්‍රවර්ධන සමුපකාර සමිතිය | සමු 61 | 2018.09.07 |
| 06 | සී/ස ශ්‍රී ලංකා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගේ සමුපකාර සමිතිය | සමු 62 | 2018.09.07 |
| 07 | සී/ස තාරුණ්‍ය සවිබල ගැන්වීමේ සමුපකාර සමිතිය | සමු 63 | 2018.10.05 |
| 08 | සී/ස හදබිම සමුපකාර සමිතිය | සමු 64 | 2018.10.05 |

## 2.2 සමුපකාර සමිති වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා කාලීනව සංශෝධන සඳහා උපදෙස් ලබාදීම.

| | සමිතියේ / සංගමයේනම |
|---|---|
| 01 | ජාතික සමුපකාර මණ්ඩලය |
| 02 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර සමිතිය |
| 03 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය |
| 04 | සී/ස සමෘද්ධි හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර සණස |
| 05 | සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතිය |
| 06 | සී/ස සෞඛ්‍ය කාර්ය මණ්ඩල සමුපකාර ණය දෙන සමිතිය |
| 07 | සී/ස සම්පත් කළමණාකරන සංධානය |
| 08 | සී/ස පේෂ කර්මාන්ත සංගමය |
| 09 | සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමණාකරණ සමුපකාර මහා සංගමය |
| 10 | සී/ස ශ්‍රී ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය |
| 11 | සී/ස ලංගම සේවක සමුපකාර ණය දෙන සමිතිය |
| 12 | සී/ස දුම්රිය මාර්ග හා වැඩ සමුපකාර ණය දෙන සමිතිය |

## 2.3 සමුපකාර සමිති/ සංගම් නිලවරණපැවැත්වීම

| | සමිතියේ / සංගමයේනම |
|---|---|
| 01 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර සමිතිය |
| 02 | සී/ස සෞඛ්‍ය මුදල් ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය |
| 03 | සී/ස වතු සේවක නිවාස සමුපකාර සමිතිය |
| 04 | සී/ස සමුපකාර අලෙවි සංගමය |
| 05 | සී/ස අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය |
| 06 | සී/ස පේෂ කර්මාන්ත සංගමය |
| 07 | සී/ස දේශිය ආදායම් සකසුරුවම් හා ණය දෙන සමිතිය |
| 08 | සී/ස මහජන සෞඛ්‍ය පරීක්ෂක සණස |
| 09 | සී/ස සමෘද්ධි හා කෘෂිකර්ම පර්යේෂණ සහකාර සණස |
| 10 | සී/ස ජලසම්පාදන සණස |
| 11 | සී/ස තේ නිපදවන්නන්ගේ සණස |
| 12 | සී/ස වරාය සුභසාධක සමුපකාර සමිතිය |
| 13 | සී/ස කාන්තාවන්ගේ සුභසාධක සමුපකාර සමිතිය |
| 14 | සී/ස කර්මාන්ත මහ සංගමය |

## 2.4 සමුපකාර සමිති වල ව්‍යවස්ථාපිත විගණන කටයුතු

මෙම දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ විගණන අංශය විසින් 2013සිට 2018දක්වා සැලසුම් කරන ලද හා කාර්යාලය වෙත ලද විගණන වාර්තා පිලිබඳ තොරතුරු පහතසඳහන් පරිදී වේ.

| වර්ෂය | සැලසුම් කළ විගණන | නිම කළ විගණන | වර්ෂය තුළ නිම කළ විගණනයන්හි ප්‍රතිශතය |
|---|---|---|---|
| 2013 | 74 | 61 | 82% |
| 2014 | 68 | 44 | 64.7% |
| 2015 | 80 | 11 | 13.75% |
| 2016 | 102 | 37 | 36.27% |
| 2017 | 58 | 43 | 74.13% |
| 2018 | 108 | 56 | 60.48% |



## 2.5 නීති කටයුතු

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකිය.

❖ සමුපකාර සමිති වලට සම්බන්ධ නීති රීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහය ලබාදීම

❖ ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම

❖ සමුපකාර පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/ සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම , ප්‍රධානයන් ලබාදීම ,අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම

❖ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි , අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

### 2.5.1 ආරවුල් බේරුම්කරණය

1992 අංක 11 හා 1983 අංක 32 දරන සංශෝධන පනත් මගින් කියවෙන 1972 අංක 5 දරණ සමිති පනතේ 58 වන වගන්තිය ප්‍රකාරව සමුපකාර සමිති සංගම් වල ආරවුල් බේරුම් කිරීම සහ ප්‍රදානයන් බල ගැන්වීම 2018 වසර තුළ පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| I. | 2017 වසරේ ලැබී ඇති ඉල්ලීම් මත බේරුම්කරුවන් පත් කිරීම | 157 |
| II. | 2018 වසරේ ලැබී ඇති ඉල්ලීම් මත බේරුම්කරුවන් පත් කිරීම | 35 |
| III. | ආරවුල් බේරුම් කිරීම හා තීන්දු ලබා දීම | 295 |
| IV. | සමාලෝචනය | 188 |

### 2.5.2 උසාවි බලගැන්වීම

1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 58 වන වගන්තිය යටතේ සමුපකාර සමිති විසින් බේරුම්කරණය සඳහා යොමු කරනු ලබන ආරවුල් සඳහා තීරක තීන්දු ලබාදීමෙන් පසු අදාළ මුදල් අය නොවන්නේ නම් සමුපකාර සංවර්ධන කොමසාරිස් විසින් එම මුදල දඩ මුදලක් සේ අය කර ගැනීමට අදාළ මහේස්ත්‍රාත් අධිකරණයෙහි බලගන්වන අතර එසේ අධිකරණයෙන් අය වන මුදල් නැවත අදාළ සමුපකාර සමිති වෙත ප්‍රේෂණය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| ❖ | 2018 වර්ෂයේ උසාවි බලගැන්වීම් | 129 |
| ❖ | උසාවි මගින් අය වූ දඩ මුදල් වටිනාකම | රු.15, 523, 529.71 |
| ❖ | සමිති වෙත නිදහස් කළ දඩ මුදල් වටිනාකම | රු. 10, 445, 796.71 |

## 2.6 අරමුදල් කළමනාකරණය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(1) (ආ) වගන්තිය සහ 57(3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදි ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර , එම අරමුදලේ දායක මුදල් අය කර ගැනීම මෙන්ම වියදම් දැරීම , ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

- සමුපකාර අරමුදල
- සමුපකාර අතිරික්ත අරමුදල

### 2.6.1 සමුපකාර අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දිප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

### 2.6.2 සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44( I )සිට 44 ( iii ) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරිම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණය හිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අයවිය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

2.7

## 2018වර්ෂය සඳහා රජයේ අයවැය මඟින් වෙන් කළ මූල්‍ය ප්‍රතිපාදන හා වියදම් දැරීම

### පුනරාවර්තන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය/අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2018.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 1001 | වැටුප් හා වේතන | 36,450,000.00 | 36,315,716.95 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,200,000.00 | 1,199,712.96 |
| 1003 | වෙනත් දීමනා | 16,425,000.00 | 16,325,773.49 |
| 1101 | ගමන් වියදම්- දේශීය | 1,500,000.00 | 1,498,875.78 |
| 1102 | ගමන් වියදම් -විදේශීය | 600,000.00 | 600,000.00 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,500,000.00 | 1,461,971.70 |
| 1202 | ඉන්ධන | 2,000,000.00 | 1,858,119.27 |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 150,000.00 | 103,244.00 |
| 1301 | වාහන | 1,850,000.00 | 1,846,423.96 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 600,000.00 | 565,605.64 |
| 1402 | තැපැල් හා සන්නිවේදනය | 1,665,000.00 | 1,664,984.75 |
| 1403 | විදුලිය හා ජලය | 3,000,000.00 | 2,999,142.80 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 310,000.00 | 308,645.98 |
| 1409 | වෙනත් | 2,717,000.00 | 2,650,767.34 |
| 1505 | වෙනත් සම්මාදම් සහ දායක මුදල් | 450,000.00 | 434,320.01 |
| 1506 | රජයේ සේවකයන් සඳහා දේපල ණය පොලී | 650,000.00 | 642,650.38 |
| | එකතුව | **71,067,000.00** | **70,475,955.01** |

## මූලධන වියදම්

| වැය විෂය අංකය | කාණ්ඩය/වැය විෂයය/අයිතම විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2018.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 2002 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000.00 | 110,700.00 |
| 2003 | වාහන | 500,000.00 | 479,109.40 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 500,000.00 | 120,527.50 |
| 2103 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 500,000.00 | 190,790.00 |
| 2202-1 | සමුපකාර ප්‍රචාරණය-සමුපදීපනී පුවත්පත මුද්‍රණය | 10,000,000.00 | 9,999,928.30 |
| 2202-2 | නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන | 6,000,000.00 | 1,954,266.00 |
| 2202-3 | මූල්‍ය සේවා නියාමනය (ග්‍රාමීය බැංකු නියාමනය) | 5,000,000.00 | 1,149,207.25 |
| 2202-4 | තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම | 1,000,000.00 | 78,463.00 |
| 2202-5 | කර්මාන්ත හා නිෂ්පාදන සමුපකාර සමිති නගා සිටුවීම | 8,000,000.00 | 237,902.75 |
| 2401 | පුහුණු කිරීම හා හැකියා වර්ධනය | 675,000.00 | 525,884.00 |
| | **එකතුව** | **32,375,000.00** | **14,882,778.32** |

**වියදම් එකතුව**

| | විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රුපියල් | 2018.12.31 දිනට මුළු වියදම රුපියල් |
|---|---|---|---|
| 01 | පුනරාවර්තන වියදම් එකතුව | 71,067,000.00 | 70,475,955.01 |
| 02 | මූලධන වියදම් එකතුව | 32,375,000.00 | 14,882,778.32 |
| | මුළු එකතුව | **103,442,000.00** | **85,358,733.00** |

## 2.8 ග්‍රාමීය බැංකු නියාමනය

2018 වර්ෂයේදී ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමිති නියාමන ඒකකය විසින් සිදු කල කාර්යයන්

- ග්‍රාමීය බැංකුවල මූල්‍ය තොරතුරු ලබා ගැනීම හා එම තොරතුරු අදාල ආයතන වෙත යොමු කිරීම.
- බැංකුවල මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 02 ක් පැවැත්වීම.
- සමුපකාර ග්‍රාමීය බැංකු, සණස හා වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමනය සඳහා පනතක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම.
- සමුපකාර ග්‍රාමීය බැංකු, සණස හා වෙනත් මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමනය සඳහා පනතක් කෙටුම්පත් කිරීමේ කමිටුවේ රැස්වීම් වාර දෙකක් පැවැත්වීම,පනතේ අන්තර්ගත විෂය ක්ෂේත්‍ර හඳුනාගැනීම හා කෙටුම්පත් කිරීමේ කාර්යය ආරම්භ කිරීම.
- බැංකු නියාමන ජාතික කමිටු රැස්වීමක් පැවැත්වීම.
- මූල්‍ය සේවා කටයුතු වල නිරත සමුපකාර සමිති 11 ක ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම.
- චක්‍රලේඛ නිකුත් කිරීම.
    - තැන්පත් මුදල් භාර ගන්නා සමුපකාර සමිති/ සංගම්වල මූල්‍ය තත්ත්ව වාර්තා ලබා ගැනීම පිළිබඳබැංකු 2018/01 චක්‍රලේඛය
    - ස්ථානීය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ බැංකු 2018/02 චක්‍රලේඛය
- සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා කටයුතුවල නියුතු සමුපකාර සමිතිවල මූල්‍ය තත්ත්ව වාර්තා ගෙන්වා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

## 2.9 ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

- **නැණ ශක්ති පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන**

" නැණ ශක්ති "පාසල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහනෙහි මූලික අරමුණ ලෙසින් ජාතික මට්ටමේ පාසල් සමුපකාර සමිති පිහිටුවීම සඳහා 2017 වසර තුළදී කටයුතු සංවිධානය කෙරුණු අතර 2018 වසරේදී එය වඩාත් සාර්ථකව සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවට හැකියාව ලැබුණි. එහිදී මෙම වසර තුල සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදී වේ.

**2018 වර්ෂයේ නැණ ශක්ති පාසැල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ පැවැත්වූ අ.පො.ස.(සා/පෙළ) විභාග සම්මන්ත්‍රණ**

| අනු අංකය | දිනය | ස්ථානය | සහභාගිත්ව පාසැල් ළමුන් ගණන | සහභාගී වූ පාසැල් |
|---|---|---|---|---|
| 01 | 2018.09.20<br>2018.09.21 | මහනුවර තෙල්දෙණිය ජාතික පාසැල | 300 | මහ/ තෙල්දෙණිය ජාතික පාසැල<br>මහ/ උඩිස්පත්තුව ද්විතියික පාසැල<br>මහ/ අම්බාල කණිෂ්ඨ විද්‍යාලය<br>මහ/ ධර්මාශෝක කණිෂ්ඨ විද්‍යාලය<br>මහ/ වැගල කණිෂ්ඨ විද්‍යාලය |
| 02 | 2018.09.28<br>2018.09.29 | අනු/ මෛත්‍රිපාල සේනානායක ම.ම.වි | 300 | අනු/ මෛත්‍රිපාල සේනානායක ම.ම.වි<br>අනු/ හොරොව්පතාන රුවන්වැලි ම.ම.වි. |
| 03 | 2018.10.23<br>2018.10.25 | ගම්/ වේයන්ගොඩ බණ්ඩාරනායක ම.ම.වි. | 350 | ගම්/ වේයන්ගොඩ බණ්ඩාරනායක ම.ම.වි. |
| 04 | 2018.10.29 | හගුරන්කෙත සංස්කෘතික මධ්‍යස්ථානය | 550 | නුව/ දියතිලක මහා විද්‍යාලය<br>නුව/ වික්ටෝරියා ජාතික පාසැල<br>නුව/ පල්ලේබෝවල මහා විද්‍යාලය<br>නුව/ සිරිමාවෝ බාලිකා විද්‍යාලය<br>නුව/ පදියපැලැල්ල මහා විද්‍යාලය<br>නුව/ රහතුන්ගොඩ විද්‍යාලය<br>නුව/ උඩගලඋඩ විද්‍යාලය |
| 05 | 2018.11.01<br>2018.11.02 | පුත්/ ආණමඩුව කන්නන්ගර ආදර්ශ මහා විද්‍යාලය | 350 | පුත්/ ආනන්ද ජාතික පාසැල<br>පුත්/ කන්නන්ගර ආදර්ශ මහා විද්‍යාලය<br>පුත්/ ආත්තිකුලම කණිෂ්ඨ විද්‍යාලය<br>පුත්/ තල්ගස්වැව කණිෂ්ඨ විද්‍යාලය<br>පුත්/ පාලියාගම ශාරිපුත්‍ර කණිෂ්ඨ විද්‍යාලය<br>පුත්/ කොට්ටගම කණිෂ්ඨ විද්‍යාලය<br>පුත්/ සංගට්ටිකුලම කණිෂ්ඨ විද්‍යාලය<br>පුත්/ දිවුල්වැව කණිෂ්ඨ විද්‍යාලය |
| 06 | 2018.11.06<br>2018.11.07 | අම්පාර නගර ශාලාව | 250 | අම්/බණ්ඩාරනායක බාලිකා විද්‍යාලය<br>අම්/ ඩී.එස්.සේනානායක ජාතික පාසැල |
| 07 | 2018.11.10<br>2018.11.11 | මොණරාගල ඇතිමලේ මහා විද්‍යාලය | 160 | මොණ/ ඇතිමලේ මහා විද්‍යාලය<br>මොණ/ ජාතික පාසැල<br>මොණ/ ගැමුණුපුර මහා විද්‍යාලය<br>මොණ/ තිස්සපුර විද්‍යාලය |
| 08 | 2018.11.27<br>2018.11.28 | කල්පිටිය අල් අක්ෂා ජාතික පාසැල | 250 | කල්/ අල් අක්ෂා ජාතික පාසැල |
| 09 | 2018.11.30 | කොබෙයිගනේ ජාතික පාසැල | 200 | කුරු/ කොබෙයිගනේ ජාතික පාසැල |

**2018 වර්ෂයේ නැණ ශක්ති පාසැල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ ජාතික අධ්‍යාපන පීඨ තුල පැවැත්වූ සම්මන්ත්‍රණ**

| අනු අංකය | දිනය | ස්ථානය | සහභාගිත්ව අභ්‍යාසලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | 2018.11.24 | යාපනය කෝපායි ජාතික අධ්‍යාපන පීඨය | 500 |

**2018 වර්ෂයේ නැණ ශක්ති පාසැල් සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ මිහින්තලේ රජරට විශ්ව විද්‍යාලය තුල පැවැත්වූ සම්මන්ත්‍රණ**

| අනු අංකය | දිනය | ස්ථානය | සහභාගිත්ව අභ්‍යාසලාභීන් ගණන |
|---|---|---|---|
| 01 | 2018.12.19 | මිහින්තලේ රජරට විශ්ව විද්‍යාලය | 500 |

**නැණ ශක්ති සමුපකාර සමිති ප්‍රවර්ධන වැඩසටහන යටතේ ලියාපංදිචි කරන ලද පාසැල් සමුපකාර සමිති**

1.යෝජිත සී/ස අල් අක්ෂා ජාතික පාසැල් සමුපකාර සමිතිය.

2. යෝජිත ආනන්ද නැණ උදාන පාසැල් සමුපකාර සමිතිය.

3. යෝජිත කන්නන්ගර ශක්ති සමුපකාර සමිතිය

4. යෝජිත සී/ස ජයන්ති පාසල් සමුපකාර සමිතිය.

5.යෝජිත සී/ස වේයන්ගොඩ බණ්ඩාරනායක මධ්‍ය විදුහල් පාසැල් සමුපකාර සමිතිය.

6. යෝජිත සී/ස හොරණ රාජකිය පාසැල් සමුපකාර සමිතිය

7 යෝජිත පො/ මින්නෙරිය ජාතික පාසල් සමුපකාර සමිතිය

8. යෝජිත පො/ විලයාය මධ්‍ය මහ විද්‍යාල පාසල් සමුපකාර සමිතිය

❖ **කෝප් සිටි 100ක් සංවර්ධනය කිරීම.**

දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන විවිධ සේවා සමුපකාර සමිති යටතේ පවත්වාගෙන යනු ලබන සමුපකාර සුපිරි වෙළඳසැල් ජාලය නව මුහුණුවරකින්, නව අරුතක් රැගෙන ලාංකේය ගම් දනව් සිසාරා ව්‍යාප්ත කිරීමේ වැඩසටහනට මැදිහත් වෙමින් මෙම වසර තුළ පළාත් මට්ටමින් කොප් සිටි 100 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන සඳහා මූලික පියවර තබන ලදී. සමුපකාර ප්‍රජාවගේ හා ශ්‍රී ලාංකේය පාරිභෝගික ජනතාවට මෙහෙවර කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය යටතේ සුපිරි වෙළඳසැල් 17 ක සියළු සංවර්ධන වැඩ අවසන් කිරීමට මෙම වසර තුළදී හැකියාව ලැබුණි.

❖ **සුළු හා මධ්‍ය පරිමාණ විමෝල් හිමියන් සඳහා සහන සැලසීම.**

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම සහන සැලසීමේ ක්‍රියාවලිය මඟින් දිවයිනේ පළාත් 5 ක් තුළ දිස්ත්‍රික්ක 8 ක් ආවරණය වන පරිදි ගොවීන් වෙත සහන සැලසීම සිදු කරනු ලබයි.

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්ක |
|---|---|---|
| 01 | උතුරු මැද | පොළොන්නරුව, අනුරාධපුර |
| 02 | වයඹ | කුරුණෑගල, පුත්තලම |
| 03 | දකුණ | හම්බන්තොට |
| 04 | නැගෙනහිර | අම්පාර, මඩකලපුව |
| 05 | මධ්‍යම | මහනුවර |

❖ **සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමයේ සංවර්ධන කටයුතු වලට දායකවීම**

දහර කඹ නිෂ්පාදන අංශයේ වහල අළුත්වැඩියා කිරීම ,ඩිකෝටිකේටඩ් වර්ගයේ කොහු නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර ලබාදීම මඟින් සමුපකාරික ප්‍රජාව නඟා සිටුවීමට මෙම වසර තුළදී දෙපාර්තමේන්තුවේ දායකත්වය ලබාදෙන ලදී.

❖ **තාරපුරම් සමුපකාර ගම්මාන ව්‍යාපෘතියේ කටයුතු සිදු කරගෙන යාම.**

සමුපකාර ගම්මාන ව්‍යාපෘතිය යටතේ මෙම වසර තුළ තාරපුරම් ගම්මානය ආශ්‍රිතව වැව සහ ශ්‍රවණාගාරය ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පැවතුණි.

❖ **Road map 2020 ව්‍යාපෘතිය milestone 5 ක් යටතේ සමුපකාර ක්ෂේත්‍රයේ විවිධ පැතිකඩයන් ආවරණය වන පරිදි සංවර්ධන කටයුතු සිදු කරගෙන යාම.**

Co-op T shop ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සී/ස මීගමුව වි.සේ.ස සමිතිය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදීම මෙම වසර තුල සිදු විය.

❖ **96 වැනි ජාතික සමුපකාර දින උත්සවය**

96 වැනි ජාත්‍යන්තර සමුපකාර දිනය 2018 වසරේදී ශ්‍රී ලංකාව පුරා සමුපකාරිකයන් ඉතා උනන්දුවෙන් හා උද්යෝගයෙන් සැමරූහ. ජාතික හා පළාත් මට්ටමින් විශිෂ්ටතා දැක් වූ සමුපකාර සමිති සඳහා සම්මාන පිරි නැමීම, කෝප් කුමරා , කුමරිය සහ කෝප් ස්ටාර් තේරීම, කාර්ය සාධන තරඟාවලිය ආදී විවිධාකාරයෙන් සමුපකාරිකයන් ඇගයීම 2018 වසර තුළදී සමුපකාර දිනයට සමගාමීව සිදු කරන ලදි. මේ සියල්ල අගයමින් 96 වැනි සමුපකාර දින සැමරුම් උළෙල මඩකලපුව වෙබර් ක්‍රීඩාංගනයේදී අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් උත්කර්ශවත් ලෙස පවත් වන ලදී. මෙම උත්සවයේ සියළු සංවිධාන කටයුතු මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

- **නියං සහනාධාර බෙදාහැරීමේ වැඩසටහන**

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන 2018 වසරේ නියඟයෙන් පීඩාවට පත් ජනතාවට සහන සැලසීමේ මෙම වැඩසටහන මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය මඟින් ක්‍රියාත්මක විය.

- **මොණරාගල දිස්ත්‍රික්කයේ පැවැත්වූ Enterprise Sri Lanka ප්‍රදර්ශනය සඳහා දායකත්වය ලබාදීම**

එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා විෂන් 2025 ප්‍රදර්ශනය මෙම වසරේ අගෝස්තු මස 29,30 හා 31 දිනයන්හි මොණරාගලදී ආරම්භ විය. එහි සියළුම අමාත්‍යාංශ වල ප්‍රදර්ශන කුටි වෙන් කර තිබූ අතර කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය යටතේ මෙම දෙපාර්තමේන්තුව මඟින් කුටියක් සකස් කර තිබුණි. එහිදී පාසල් ළමුන් ඇතුළු විශාල පිරිසක් සමුපකාර විෂය පිලිබඳ දැනුම ලබා ගැනීම පිණිස ප්‍රදර්ශන කුටිය වෙත පැමිණෙන ලදී.

## 2.10 මාධ්‍ය කටයුතු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාධ්‍ය අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රමුඛතම කාර්ය වන්නේ සමුපකාර ව්‍යාපාරය පිළිබඳව රටේ ජනතාවට තොරතුරු බෙදාදීමයි.

**සමුපදීපනී පුවත්පත**

ඒ සඳහා 2006 වසරේ සිට සමුපදීපනී පුවත්පත් අතිරේකය නිකුත් කිරීමෙන් එම කාර්ය ඉටුකරනු ලබයි. සෑම මසකම අවසන් සිකුරාදා දින සමුපදීපනී සිංහල මාධ්‍ය අතිරේකය පිටු 08 කින් යුතුව දිනමිණ පුවත්පත සමඟ ද දෙමළ මාධ්‍ය අතිරේකය එක් පිටුවකින් යුතුව තිනකරන් පුවත්පත සමඟ ද එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම හා සම්බන්ධ වී ප්‍රකාශයට පත්කරනු ලබයි. මෙහිදී රට වටා ඇති සමුපකාර සමිතිවලින් සාර්ථක සමිති පිළිබඳව සවිස්තර වාර්තා ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකා සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය සිට විකාශය දක්වා වාර්තා පළ කිරීම,ලෝක සමුපකාර ව්‍යාපාරය පිළිබඳ විස්තර ඉදිරිපත් කිරීම වැනි දෑ සමුපදීපනී පුවත්පතේ පළ කරයි. මෙම වසර තුළදී ද සමුපදීපනී අතිරේකය සිංහල මාධ්‍යයෙන් පුවත්පත් 12 ක් සහ දෙමළ මාධ්‍යයෙන් පුවත්පත් 12 ක් මුද්‍රණය කරන ලදී.

## 2.11 තොරතුරු තාක්ෂණ ඒකකය

ශ්‍රී ලංකා ආර්ථිකය තුළ ක්‍රියාත්මක රාජ්‍ය ව්‍යවසායන් සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ තරග කරන දැවැන්ත ව්‍යවසායක් ලෙස සමුපකාර ව්‍යාපාරය සියවසකට ආසන්න කාලයක් තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. නමුත් වර්තමාන සමුපකාර ව්‍යාපාරයේ ආර්ථික හා ආර්ථික නොවන තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා ගැනීමේ අපහසුව නිසාම රටේ ආර්ථික තීරණ ගැනීමේදී ද සමුපකාර ව්‍යාපාරය දක්වන දායකත්වය මඟ හැරී ගොස් ඇත.

මෙම අඩුපාඩුව හඳුනාගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු ස්වයංක්‍රීය කළමනාකරණ තොරතුරු පද්ධතියක් යටතේ සිදු කිරීමටත් පසුව සමුපකාර ව්‍යාපාරය මෙම තොරතුරු පද්ධතිය මගින් සම්බන්ධ කර ගැනීම මගින් මෙම අඩුපාඩුව මඟහරවා ගනිමින් ඵලදායී කාර්යක්ෂම සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපනය කිරීමේ අරමුණ සහිතව 2017 වර්ෂයේදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ තොරතුරු තාක්ෂණ ඒකකයක් ස්ථාපනය කරගන්නා ලදී. එම ඒකකය වඩාත් ශක්තිමත් වෙමින් මෙම වසර තුළ සුවිශාල කාර්ය භාරයක් ඉටු කර ඇත.

- Info-Coop ව්‍යාපෘතිය සම්බන්ධව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම හා ව්‍යාපෘතිය හා සම්බන්ධව ප්‍රගතිය සාකච්ඡා කිරීම.
- Info-Coop ව්‍යාපෘතියට අදාලව සමුපකාර සමිති වල තොරතුරු රැස් කර එවා විශ්ලේෂණය කර වාර්තා සැකසීම.
- සමුපකාර සමිති තොරතුරු ප්‍රශ්නාවලියක් හරහා ලබාගෙන එම තොරතුරු Info-Coop ව්‍යාපෘතියට අදාලව තොරතුරු පද්ධති සකස් කිරීමට උපදෙස් ලබාදීම සඳහා කැළණිය විශ්වවිද්‍යාලය වෙත යැවීම.
- Info-Coop ව්‍යාපෘතියට අවශ්‍ය පළාත් තොරතුරු ලබා ගැනීම (දැනට පළාත් 07ක තොරතුරු ලබාගෙන ඇත.)
- Info-Coop ව්‍යාපෘතියට අදාලව සංකල්පමය පත්‍රිකාව (Concept Note) ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යැවීම.
- දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ආරක්ෂාව SLCERT ආයතනයෙන් වාර්තාවක් ලබා ගැනීම.
- දෙපාර්තමේන්තුවේ ෆේස්බුක් ගිණුම යාවත්කාලීන කිරීම.
- වෙනත් අංශ සඳහා තොරතුරු තාක්ෂණ සහාය ලබාදීම
- 96 වන ජාත්‍යන්තර සමුපකාර දිනයේ ආරාධනා පත්, වාහන අවසර පත්, සැමරුම් පොත් ආදිය මුද්‍රණයේදී ඒ සඳහා අවශ්‍ය ආකෘති නිර්මාණය කර දීම.

# 3 පරිච්ඡේදය

## ජාතික මට්ටමේ සමුපකාර සංවිධාන

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13 ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම් හී කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මහපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරීත්වය පිලිබඳව සෘජු අධීක්ෂණයක් ලබා දෙන ලදී.

### 3.1 වර්ෂය තුල ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

| | සංගමයේ නම | ලියාපදිංචි අංකය | ලියාපදිංචි දිනය |
|---|---|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය | සී 1086 | 1942.04.01 |
| 02 | සී/ස ශ්‍රී ලංකා ධීවර සමුපකාර සමිති මහා සංගමය | සී1227 | 1952.02.02 |
| 03 | සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය | සී 2490 | 1972.0726 |
| 04 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය | සි 2504 | 1973.03.01 |
| 05 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය | සී 2527 | 1974.03.19 |
| 06 | සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණයගණුදෙනු සමුපකාර සමිති මහා සංගමය | සි 2651 | 1980.11.10 |
| 07 | සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය | සී 2559 | 1981.09.02 |
| 08 | සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය | සි 2689 | 1986.01.01 |
| 09 | සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය | සමු 01 | 1989.09.15 |
| 10 | සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහා සංගමය | සමු 17 | 1997.12.15 |
| 11 | සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය | සමු 29 | 2003.10.07 |
| 12 | සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ මහා සංගමය | සමු 30 | 2005.11.21 |
| 13 | සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය | සමු 33 | 2007.02.23 |

## 3.2 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

දෙපාර්තමෙන්තුවේ අධීක්ෂණයට හා මෙහෙයවීමට යටත්ව දිප ව්‍යාප්ත සමුපකාර සමිති 53 ක් 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. මෙම සමුපකාර සමිති ප්‍රධාන කාණ්ඩ 02 කට වර්ග කර දැක්විය හැකිය.

- දිප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති
- දිප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

### 3.2.1 දිප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

1. සාමාජික ඉතුරුම් රාශිකරණය
2. සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
3. සාමාජික සුභ සාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්ව ආධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
4. ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

### 3.2.2 දිප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලිම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයිමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයිමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දිපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිති වල මුලික කාර්යයන්

- සාමාජිකයින්ගේ නිෂ්පාදන මිලදි ගැනිම
- නිෂ්පාදන හා සේවා සැපයිම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම
- සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදිම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරිම
- සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම

## 3.2.3 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ සමුපකාර සමිති

| | සමිතියේ නම |
|---|---|
| 01 | සී/ස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සමුපකාර බැංකුව |
| 02 | සී/ස සමස්ථ ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය |
| 03 | සී/ස සමස්ථ ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය |
| 04 | සී/ස මැනුම් දෙපාර්තමේන්තුවේ මැනුම් සහයකවරුන්ගේ සමුපකාර සමිතිය |
| 05 | සී/ස ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සංවර්ධන සේවා සමුපකාර සමිතිය |
| 06 | සී/ස සණස සංවර්ධන බැංකුවේ සේවක සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබද සමුපකාර සමිතිය |
| 07 | සී/ස සමෘද්ධි සංවර්ධන හා කෘෂිකාර්මික සහකාර නිළධාරීන්ගේ ස.ණ.ස. සමිතිය |
| 08 | සී/ස ශ්‍රී ලංකා වතු සේවා නිළධාරීන්ගේ නිවාස සමුපකාර සමිතිය |
| 09 | සී/ස ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමස්ථ සේවකයින් සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිතිය |
| 10 | සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබද සමුපකාර සමිතිය |
| 11 | සී/ස සමස්ථ ලංකා සුළු හා මධ්‍ය පරිමාණ ධාන්‍ය සැකසුම්කරුවන්ගේ ව්‍යවසායකත්ව සංවර්ධන සමුපකාර සමිතිය |
| 12 | සී/ස වරාය නැව් සේවා සමුපකාර සමිතිය |
| 13 | සී/ස නිවාස හා දේපල සංවර්ධන සමුපකාර සමිතිය |
| 14 | සී/ස රජරට විශ්ව විද්‍යාලයීය සමුපකාර සමිතිය |
| 15 | සී/ස සමස්ථ ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය |
| 16 | සී/ස ප්‍රජාශක්ති තරුණ අභිවෘද්ධි සමුපකාර සමිතිය |
| 17 | සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සංවර්ධන සමුපකාර සමිතිය |
| 18 | සී/ස ශ්‍රී ලංකා ව්‍යවසාය සංවර්ධන සමුපකාර සමිතිය |
| 19 | සී/ස ශ්‍රී ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය |
| 20 | සී/ස ජාතික වාණිජ සමුපකාර සමිතිය |
| 21 | සී/ස ශ්‍රී ලංකා සංවර්ධන හා ආයෝජන සමුපකාර සමිතිය |
| 22 | සී/ස සමස්ථ ලංකා මල් හා විසිතුරු පැළ වගාකරුවන්ගේ සමුපකාර සමිතිය |
| 23 | සී/ස විගණන හා කළමණාකරණ සේවා සැපයීමේ සමුපකාර සමිතිය |
| 24 | සී/ස ශ්‍රී ලංකාවේ හරිත සමුපකාර සමිතිය |
| 25 | සී/ස ජාතික පරිසරය සුරකින්නන්ගේ සමුපකාර සමිතිය |
| 26 | සී/ස ව්‍යාපාර කළමණාකරණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන හා තාක්ෂණික සේවා උපදේශන සමුපකාර සමිතිය |

| | |
|---|---|
| 27 | සී/ස ජාතික විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ සමුපකාර සමිතිය |
| 28 | සී/ස ජනමාධ්‍යවේදීන්ගේ සමුපකාර සමිතිය |
| 29 | සී/ස ශ්‍රී ලංකා අත් යන්ත්‍ර නිෂ්පාදකවරුන්ගේ අලෙවි කිරීම් හා ව්‍යවසායකයින්ගේ සමූපකාර සමිතිය |
| 30 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තු සේවක සණස |
| 31 | සී/ස බන්ධනාගාර සේවා සැපයුම් ගොඩනැගිලි ඉදි කිරීම් කම්කරු සමුපකාර සමිතිය. |
| 32 | සී/ස දුම්රිය ස්ථානාධිපති හා ලිපිකරු සණස |
| 33 | සී/ස අධ්‍යාපන සේවානියුක්තිකයින්ගේ සමුපකාර සමිතිය |
| 34 | සී/ස ජාතික පුහුණු වෘත්තියවේදීන්ගේ සමූපකාර සමිතිය |
| 35 | සී/ස සමස්ථ ලංකා විදේශ භාෂා අධ්‍යාපන ප්‍රවර්ධන සමූපකාර සමිතිය |
| 36 | සී/ස මහජන බැංකු සේවක සමූපකාර සමිතිය |
| 37 | සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්‍යෝන්‍ය අර්ථසාධක අරමුදල් සමූපකාර සමිතිය |
| 38 | සී/ස තාරුණ්‍ය සවිබල ගැන්වීමේ සමු.සමිතිය |
| 39 | සී/ස හදබිම සමූපකාර සමිතිය |
| 40 | සී/ස අල් අක්ෂා පාසල් සමුපකාර සමිතිය |
| 41 | සී/ස කන්නන්ගර ශක්ති පාසල් සමුපකාර සමිතිය |
| 42 | සී/ස බ්‍රවුන් හවුලේ කාර්මික හා පොදු සේවා සණස |
| 43 | සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවා සමූපකාර සමි. |
| 44 | සී/ස රාජ්‍ය සේවා සමූපකාර ණය දීමේ හා ඉතිරි කිරීමේ සමිතිය |
| 45 | සී/ස සමුපකාර දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සණස |
| 46 | සී/ස සතොස සේවකයන්ගේ සමූපකාර සකසුරුවම් ඉතිරි කිරීම් හා ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය |
| 47 | සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමූපකාර බැංකු සංගමය |
| 48 | සී/ස මුද්‍රණ ශිල්පීන්ගේ සණස |
| 49 | සී/ස රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවේ සේවක සණස |
| 50 | සී/ස ලංගම සේවක සකසුරුවම් හා සුභසාධක සමූපකාර සමිතිය |
| 51 | සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමූපකාර සමිතිය |
| 52 | සී/ස දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය |
| 53 | සී/ස සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සමුපකාර සකසුරුවම් සහ ණය ගණුදෙනු පිළිබඳ සමිතිය. |